ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය වෙනුවෙන් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව තහවුරු කළ නොහැකි විය.

(ආ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් එම වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව රු.15,440,833 ක් ලෙසත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.15,279,148 ක් ලෙසත් දක්වා තිබීම හේතුවෙන් එම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.161,685 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ සඳහන් ශේෂය අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවීම. | එකඟ වෙමි. ඉදිරි වර්ෂවලදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට කටයුතු කරමි. |
| (ආ) චක්‍රලේඛයේ 07 (vi) ඡේදය ප්‍රකාරව අග්‍රිම ගිණුම් ශේෂය සැසඳීම සඳහා අග්‍රිම ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතුව තිබුණද, විගණනයට ඉදිරිපත් කර තිබුණු අග්‍රිම ගැලපුම් ගිණුම මගින් එම සැසඳීම නිවැරදිව සිදු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අග්‍රිම ගිණුම් ශේෂය සැසඳීම සඳහා නිවැරදි අග්‍රිම ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතු වීම. | උප බදු කුලී ආදායම වූ රු.2,073,007 ක මුදල සහ මාසික ගිණුම් සාරාංශ හා දෙපාර්තමේන්තු පොත්වල ඇතුළත් නොවූ රු.4,906,676,987 ක මුදල අග්‍රිම ගිණුමට අදාල නොවේ. තැන්පතු ලැබීම් හා ගෙවීම් අඩුවෙන් ගිණුම්ගත කිරීම සහ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලැබීම් අඩුවෙන් සටහන් වූ මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන් අදාල ගැලපීම් 2019 වර්ෂය තුළ සිදු කිරීමට නියමිතය. |

**1.6.2 මූල්‍ය කර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) භාණ්ඩාගාර පරිගණක වගුව 70 අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අදාල ආදායම් සංකේතයේ එකතුකළ ආදායම රු.873,390,089 ක් වී තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම ආදායම් රු.871,317,082 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව එකතුකළ ආදායම රු.2,073,007 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | චක්‍රලේඛය අනුව භාණ්ඩාගාර පරිගණක වගුවේ 70 ට රැස්කළ සම්පූර්ණ ආදායම, ආදායම් ගිණුමට ඇතුළත් කළ යුතුවීම. | පරිගණක මුද්‍රිත සටහන්වල කල්බදු කුලී ආදායම ලෙස රු.873,390,089 ක් දක්වා ඇති අතර, ප්‍රාදේශිය වැවිලි සමාගම්වල කල්බදු කුලී ආදායම ලෙස 2018 වර්ෂයේදි අය කළ මුදල රු.871,317,082 ක් වේ. එහි වෙනස වන රු.2,073,007 ක මුදල ප්‍රාදේශිය වැවිලි සමාගම් විසින් තෙවන පාර්ශවයක් වෙත ඉඩම් උප බදු දීම් සඳහා රජය විසින් අය කළ සියයට 20 ක මුදල වේ. |
| (ආ) විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු මාසික ගිණුම් සාරාංශ හා දෙපාර්තමේන්තු පොත්වල ඇතුලත් නොවූ රු.4,906,676,987 ක මුදල වෙනත් ලැබීම් වශයෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කිරීම හෝ භාණ්ඩාගාරයෙන් විමසා කටයුතු කළ යුතුවීම. | කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ මූල්‍යකරණය 12 යටතේ ලැබීම් රු.713,599,987 ක් හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ලද මුදල් රු.4,193,077,000 ක එකතුව රු.4,906,676,987 ක් වේ. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල තැන්පත් ශේෂ ගිණුම්ගත කිරීමේදී භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ ශේෂය වූ රු.41,017,827 ක් සටහන් කිරීම වෙනුවට දෙපාර්තමේන්තු පොත් | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තැන්පතු ගිණුමේ ශේෂය, භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ සඳහන් ශේෂය විය යුතුවීම. | එකඟ වෙමි.<br>මේ වන විට මෙම ශේෂ අතර වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමින් පවති. |

| | | |
|---|---|---|
| අනුව ශේෂය වූ රු.41,038,327 ක් සටහන් කිරීම නිසා ශේෂය රු.20,500 කින් වැඩිපුර සටහන් කර තිබුණි. | | |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.16,850,000 ක් වටිනා වාහන 03 ක් වෙන්දේසි කර තිබුණද එම වටිනාකම් ස්ථාවර වත්කම්වලින් ඉවත් නොකිරීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අපහරණය කරන වත්කම්, ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කළයුතු වීම. | එකඟ වෙමි. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බැවින් ඉදිරියේදී මෙම වරද සිදු නොවනු ඇත. |
| (ඇ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ව්‍යාපෘති දෙකක් සඳහා 2018 වර්ෂය තුළ මිලට ගත් එකතුව රු.188,903 ක් වටිනා කාර්යාල උපකරණ, ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම්, ලේඛනයක සටහන් විය යුතුවීම. | එකඟ වෙමි. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම මේ වන විට සිදුවන බැවින් එම උපකරණ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් නොවන ලැබීම් රු.1,249,278,798 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස රු.7,042,541,616 ක් සටහන් කර තිබීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් රු.5,793,262,818 ක් වැඩියෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව ආදායම් නොවන ලැබීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | සංශෝධිත ආකෘතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඩුපාඩු සිදු වී ඇති බැවින්, 2019 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි එවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු යොදා ඇත. |
| (ආ) විගණනයට ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ හා වෙනත් තොරතුරු අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ගලායාම් රු.1,243,550,144 ක් | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය නිවැරදිව සටහන් කළයුතු වීම. | - එම - |

| | | | |
|---|---|---|---|
| | වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.2,971,633,037 ක් ලෙස දැක්වීම නිසා රු.1,728,082,893 ක වෙනසක් නිරික්ෂණය විය. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ රු.16,776,127 ක් අයකර ගෙන තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය දක්වා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ අයකර ගැනීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතුවීම. | - එම - |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් රු.22,504,771 ක් විය යුතු වුවද, එය රු.3,133,384,349 ක් ලෙස දැක්වීම නිසා රු.3,110,879,578 ක වෙනසක් නිරික්ෂණය විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එක් එක් ක්‍රියාකාරකම් යටතට වැටෙන ගණුදෙනු නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුවීම. | - එම - |

### 1.6.5 අත්තිකාරම් ගිණුම් ශේෂ

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව වූ රු.869,100 ක ණය ශේෂ, වසර 01 ත් වසර 29 ත් අතර කාලයක් තිස්සේ හිඟ හිටව පැවතෙන අතර ඒවා නිරවුල්කර නොතිබුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය පරිදි කටයුතු කර නිරවුල් කළ යුතුවීම. | එකඟ වෙමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් අනුව රු.34,851,438 ක්ද, අමාත්‍යාංශ පොත් අනුව රු.34,794,669 ක් ලෙසද | මු.රෙ 427 අනුව අමාත්‍යාංශ පොත් , භාණ්ඩාගාර පොත් සමග සසඳා වෙනස්කම් හඳුනාගත යුතුවීම. | එකඟ වෙමි.<br>මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| සඳහන් වූ අතර ඒ අනුව වූ රු.56,769 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |

**1.6.6 අග්‍රිම ශේෂය**

-------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ භාණ්ඩාගාර අග්‍රිම ගිණුමේ ශේෂය රු.92,000 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනයෙහි ACA 03 ආකෘතියෙහි දක්වා නොතිබුණි. | පෙර වර්ෂයට අදාල අග්‍රිමය තිබේ නම් එය ACA 03 ආකෘතියෙහි පෙන්වීමට කටයුතු කල යුතුවීම. | එකඟ වෙමි. ඉදිරි මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී එම දෝෂ ඇති නොවීමට කටයුතු කරමි. |

**1.6.7. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

--------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඇප ලේඛනය<br>----------------<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | සේවක ඇප තැන්පතු පිළිබඳ ඉදිරියේදී මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) හානි පිළිබඳ ලේඛනය<br>------------------------<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලිනව පවත්වා ගත යුතුවීම. | පාඩු හා හානි ලේඛනය විධිමත්ව සහ යාවත්කාලීනව පවත්වා ගැනීමට ඉදිරියේදි කටයුතු කරමි. |

**1.6.8 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ (මු.රෙ) 1646 | වාහන භාර නිලධාරීන් විසින් සෑම මාසයකටම පසු ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම 268(අ) පොදු ආකෘතියේ ලියන ලද මාසික සාරාංශයේ මුල් පිටපතක්ද සමඟ, දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට මාසික සාරාංශයේ පිටපතක්ද සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කල යුතු වීම. | එකඟ වෙමි. 2019 ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් හා මැයි මාසවල දෛනික ධාවන සටහන් 2019 ජූනි මස 15ට පෙර විගණන අධිකාරි වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට එම සමාගම් අතුරින් සමාගම් 11 කින් රජයට අයවිය යුතු රු.මිලියන 511.62 ක බදු ආදායම හිඟහිටව තිබූ අතර, එම මුදල් අයකරගැනීමට අදාල ගිවිසුම් පරිදි ක්‍රියාමාර්ග | ගෙවීම් පැහැර හරින සමාගම් සම්බන්ධයෙන් ගිවිසුම්වල සඳහන් විධිවිධාන පරිදි කටයුතු කළ යුතුවීම. | 2018 දෙසැම්බර් 31 දිනට වැවිලි සමාගම් 11 කින් රජයට අය විය යුතු බදු මුදල රු.511,623,964 කි. 2018 වර්ෂය තුළ හිඟ බදු කුලී හා වාර්ෂික බදු කුලී අය කරගැනීම සඳහා හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | ගෙන නොතිබුණි. | | |
| (ආ) | වැවිලි සමාගම් සමඟ ඇති කර ගෙන තිබූ කල් බදු සංශෝධන ගිවිසුම් අනුව එක් එක් කාර්තුව සඳහා එහි සඳහන් නියමිත දිනයන්ට කල්බදු කුලී නොගෙවීම් නිසා එම ආදායම් ලැබීම ප්‍රමාද වී තිබුණි. | එක් එක් කාර්තුව සඳහා එහි සඳහන් නියමිත දිනයන්ට බදු කුලිය ලබාගැනීමට කටයුතු කළ යුතුවීම. | 1995 නොවැම්බර් 27 දිනැති අංක 1558 දරණ කල්බදු සංශෝධන ගිවිසුම අදාල වන්නේ කුරුණෑගල වැවිලි සමාගමට වේ. කුරුණෑගල වැවිලි සමාගම රජය යටතේ පවතින බැවින් හා එම සමාගම විසින් බදු කුලී ගෙවීම සම්පූර්ණයෙන් පැහැර හැරීමක් සිදු කර නොමැති බැවින්, ඔවුන්ගේ ගණනය කිරීම් අනුව අඩු බදු කුලියක් ගෙවනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මුදල් අමාත්‍යාංශ ලේකම්ගෙන් උපදෙස් ඉල්ලා ඇත. |
| (ඇ) | 1992 වර්ෂයේදී වැවිලි සමාගම් 23 ක් වෙත ලබා දී තිබූ රජයට අයත් එකතුව අක්කර 617,486 ක් වූ වතුවලින්, අක්කර එකකින් ලැබෙන වාර්ෂික බදු කුලී ආදායම රු.433 ත්, රු.2,780 ත් අතර අඩු වටිනාකම් පරාසයක් ගෙන තිබූ බැවින් වර්තමානයේ ඉඩම්වල වාණිජ වටිනාකම සළකා බලා අය කරනු ලබන බදු කුලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | බදු කුලිය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | වාර්ෂිකව අය විය යුතු බදු කුලිය තීරණය වී ඇත්තේ එම සමාගම්වල 1994 දෙසැම්බර් 31 දිනට පැවති ශුද්ධ වත්කම් වටිනාකම මත ය. කෙසේ වුවද සියළුම වැවිලි සමාගම් සමඟ අත්සන් කර ඇති බදු ගිවිසුම්වල සඳහන් කොන්දේසිවල සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇත. මෙම අමාත්‍යාංශයේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර මෙම කරුණ ද ඇතුලත්ව සමස්ථයක් ලෙස මෙම බදු ගිවිසුම්වල හා ස්වර්ණමය කොටස් හිමිකරුගේ බලතලවල සිදුවිය යුතු වෙනස්කම් නිර්දේශ ලෙස ලබාගෙන ඉහළ මට්ටමේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා එම නිර්දේශ ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | 1992 වර්ෂයේදී රජයට අයත් ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු දීමේදී, බදු කුලිය ගණනය කිරීම සඳහා ශුද්ධ වත්කම් වටිනාකම රු.මිලියන 200 ඉක්මවා තිබිය යුතුවිය. ඒ අනුව එදිනට එම වටිනාකමට අඩු වූ වැවිලි සමාගම් 03 ක් වෙත ඉඩම් හෙක්ටයාර් 20,757 ක් බදු | රජයට අයත් වතුවල ශුද්ධ වත්කම් වටිනාකම පිළිබඳ නැවත අධ්‍යනය කර බදු අයවියයුතු වතුවලින් බදු අයකිරීමට කටයුතු කල යුතුවීම. | සමස්ථ වශයෙන් සියළුම වැවිලි සමාගම් සමඟ අත්සන් කර ඇති බදු ගිවිසුම්වල සඳහන් කොන්දේසිවල සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | කුලී රහිතව ලබා දී වසර 26 ක කාලයක් ගත වී තිබුණි. වර්තමානය වනවිට ඉන් සමාගම් දෙකක ශුද්ධ වත්කම් රු.මිලියන 200 ඉක්මවා තිබුණු බැවින් එවැනි අවස්ථාවලදී ක්‍රියාකලයුතු ආකාරය සම්බන්ධ ප්‍රතිපාදන බදු ගිවිසුමේ සලසා නොමැතිවීම නිසා බදු කුලී අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | | |
| (ඉ) | 2017 පෙබරවාරි 15 දිනැති අංක **PE/PL/RP/Gen/**2017 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව රජයේ ඉඩම් උප බදුදීම් තුළින් උපයන කුලී ආදායමෙන් සියයට 20 ක ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට අය කිරීමට නියම කර තිබුණි. එසේ වුවත්, 2017 ට පෙර උපබදු දී තිබූ වැවිලි සමාගම් 05 කට 2018 වර්ෂයට අදාළව රු.මිලියන 36.51 ක ආදායමක් ලැබී තිබුණද, එම සමාගම්වලින් සියයට 20 ක රජයේ කොටස අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උප බදුදීම් තුළින් උපයන කුලී ආදායමෙන් සියයට 20 ක ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට අය කිරීමට කටයුතු කළ යුතුවීම. | 2018 වර්ෂය සඳහා වැවිලි සමාගම් 3ක් විසින් පමණක් උප බදු දීම් සිදුකර ඇති අතර, එය පහත පරිදි සිදු කරන ලදී. ඒ අනුව මෙම සමාගම්වලින් සියයට 20 කොටස රජයට ලබා ගැනීම සඳහා ඔවුන් වෙත ලිපි මගින් දන්වා ඇති අතර එම මුදල් ගෙවන තෙක් එම සමාගම්වල ඉඩම් නැවත උප බදු දීම් නතර කර ඇත. |
| (ඊ) | බදු ගිවිසුම් ප්‍රකාරව රජයේ අවශ්‍යතාවය මත වැවිලි සමාගම් වෙත ලබා දුන් ඉඩම් ආපසු අත්කර ගැනීමේ හැකියාව තිබියදී, වැවිලි සමාගමක් විසින් අක්කර 01 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත 2011 මැයි 31 දින සිට 2045 ජූනි 17 දින දක්වා කාල පරාසයක් දක්වා වාර්ෂිකව රු.මිලියන 12.22 ක උප බදු වටිනාකමක් යටතේ නැවත රජයේ ආයතනයකටම ලබාදී තිබුණි. | රජයේ අවශ්‍යතාවය මත වැවිලි සමාගම් වෙත ලබා දුන් ඉඩම් ආපසු අත්කර ගැනීමේ හැකියාව තිබියදී, වැවිලි සමාගම විසින් බදුකුලියක් අයකරගනිමින් එම ඉඩම් නැවත රජයේ ආයතනයකටම බදු පදනම යටතේ ලබාදීම තුලින් උපයාගන්නා ආදායම රජයට ලබාගත හැකි වන පරිදි විධිවිධාන සැලසීම. | එකඟ වෙමි. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 2256 ක ප්‍රතිපාදනවලින්, එකතුව රු.මිලියන 963 ක උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා සලසා තිබෙන ප්‍රතිපාදන උපයෝජනය කලහැකි පරිදි සැලසුම් කළ කාල පරාසයන් තුල ප්‍රතිපාදන ඉල්ලීම් කළයුතු වීම. | ප්‍රාග්ධන වැය විෂයන්ට අදාළ ප්‍රතිපාදන ඉතිරි වීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් නියමිත පරිදි අක් මුදල් නොලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇති අතර රජයේ ප්‍රතිපත්ති මත ඇතැම් ව්‍යාපෘති අතරමග නවතා දැමීමට හා ඇතැම් ව්‍යාපෘති 2019 වර්ෂය දක්වා කල් දැමීමට සිදු වීම උපයෝජනය නොකර ඉතිරි වීමට හේතුවිය. |
| (ආ) | සංවර්ධන උප ව්‍යාපෘති 04 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් ලබා දී තිබු රු.මිලියන 425 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 314.71 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර එම ප්‍රතිපාදන අත්‍යාවශයද යන්න තීරණය කල යුතු වීම. | පිළිතුරු ලබා දී නැත . |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 ක් සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් සියයට 85 ත්, සියයට 100 ත් අතර ප්‍රමාණයක් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබූ බැවින් එම වැය විෂයයන් සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබීම ඵල රහිත විය. | වැය විෂයයන් සඳහා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී සැලකිලිමත් ලෙස පිළියෙල කල යුතුවීම. | අමාත්‍යාංශයේ කටයුතු පවත්වාගෙන යාමේදී ඉදිරි වර්ෂය තුළ දැරීමට සිදු වෙතැයි අපේක්ෂා කරන වියදම් සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලබන අතර ඇතැම් අවස්ථාවලදී එම වියදම් දැරීමේ අවශ්‍යතාවක් පැන නොනගී. එසේම ඇතැම් අවස්ථාවලදී ඇස්තමේන්තු කරන ලද මුදල් ප්‍රමාණය, වියදම් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් වියදම් දැරීමට සිදු නොවූ වැය ශීර්ෂවල ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ මුදල් අවශ්‍යතා සහිත වැය ශීර්ෂවලට මාරු කරනු ලැබේ. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

**---------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්ය නිම කර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේදී ලබා දී තිබූ එකතුව රු.219,990 ක් වටිනා තත්කාර්ය අතුරු අග්‍රිම 19 ක් පියවීම සඳහා දින 04 ත්, දින 96 ත් අතර කාලයක් ගතකර තිබුණි. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | එකඟ වෙමි.<br>මේ පිළිබඳව අමාත්‍යාංශ නිලධාරින් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී ප්‍රමාද නොවීම් සිදු නොවීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**3.1 සැලැසුම් කිරීම**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුනද එම සැලැස්මෙහි අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම, අක් මුදල් අවශ්‍යතා සැලැස්ම ආදිය ඉදිරිපත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංවිධාන ව්‍යුහය ඇතුළු දක්වා ඇති සියලු අවශ්‍යතා ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත කළ යුතුවීම. | එකඟ වෙමි.<br>2019 සංශෝධිත ක්‍රියාත්මක සැලැස්මට අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරයක් ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.<br>2019 වර්ෂයට අදාළ සංශෝධිත ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ද පිළියෙල කරමි.<br>අනුමත ඇස්තමේන්තු අනුව වාර්ෂිකව අක් මුදල් සැලැස්ම පිළියෙල කරනු ලබන අතර එය 2020 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| | | කරමි. සංවර්ධන වැඩසටහන්වලට අදාළව එම ආයතන විසින් සකස් කරනු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම එම ආයතනවල ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර ඇත. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 250 ක ප්‍රතිපාදන යටතේ කුඩා තේ වතු අංශයේ ඵලදායිත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියෙන් කුඩා තේ වතු හිමියන් සඳහා ජල ටැංකි 10,000 ක්, වතුර පොම්ප 3,500 ක් හා ස්ප්‍රේ යන්ත්‍ර 4,500 ක් ලබාදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත් 2018 වර්ෂය අවසාන වන විට ඉන් ස්ප්‍රේ යන්ත්‍ර 1,456 ක් මිලදී ගැනීම සඳහා පමණක් රු.මිලියන 18 ක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබූ අතර, ඉතිරි යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි. | අපේක්ෂිත කාල රාමුව තුළ ප්‍රසම්පාදන කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබිය යුතු වීම. | අක් මුදල් ලැබීමේදී තිබූ අක්‍රමවත් බව හේතුවෙන් නව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර 2019 වර්ෂයේ මෙම ව්‍යාපෘති කිරීමට අනුමත කර ගන්නා ලදී. එම නිසා උක්ත ව්‍යාපෘතිය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගෙන තිබූ රු.250,000,000 ක මුදලින් රු.231,966,712 ක් ඉතිරි වූ අතර එම ප්‍රතිපාදන ඉතිරිය පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩුවක් නිසා සිදු නොවූවක් බව කාරුණිකව දන්වමි |

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල හා ශ්‍රී ලංකා රජයේ මූල්‍ය දායකත්වය යටතේ 2016 සිට 2021 කාල පරාසය තුළ ක්‍රියාත්මක කරනු ලබන කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 1,400 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2018 වර්ෂයේදී | අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම කාර්යක්ෂමතාවයෙන් යුතුව කටයුතු කළ යුතු වීම. | ඉඩම් හෙක්ටයාර 2449.13 ක් සඳහා අයදුම්පත්‍ර කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් වී තිබූ අතර ඉන් හෙක්ටයාර 1428.61 ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර ඇත. එයින් හෙක්ටයාර 1344 ක් සඳහා පමණක් පෙරගෙවුම් අවසන් කර තිබුණි. 2018 වර්ෂය සඳහා රබර් නව වගාව සඳහා වන සංරක්ෂණ |

| | | |
|---|---|---|
| තේ වතු හෙක්ටයාර් 2,115 ක් , රබර් වතු හෙක්ටයාර 1,000 ක් සහ මාර්ග 31 ක් සංවර්ධනය කිරීමට ඉලක්ක කර තිබුණද ඉන් කුඩා තේ වතු හෙක්ටයාර 1,344 ක් , රබර් ඉඩම් හෙක්ටයාර 293 ක් සහ කෘෂි ප්‍රවේශ මාර්ග 24 ක් පමණක් නිම කිරීම නිසා අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමේ අකාර්යක්ෂමතාවයක් ඇතිවී තිබුණි. | | දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු රජයේ ඉඩම් නිදහස් කර ගැනීමට හා නියමානුකූල කිරීමට දීර්ඝ කාලයක් ගත විය. පැල සිටුවීම වර්ෂයේ අවසන් මාසය දක්වා සිදුවු බැවින් මින් ඉඩම් හෙක්ටයාර 293 කට පමණක් 2018 වර්ෂය තුල පෙරගෙවීම් සිදුකර ඇත.<br>2018 වර්ෂයේ අවසන් කාර්තුව තුල මෙම සියළු ව්‍යාපෘති ආරම්භ කළ අතර එම කාලය තුල පැවති දැඩි වර්ෂාව හේතුවෙන් සැලසුම් කල මාර්ග 165 ක් 2018 දෙසැම්බර් අවසානය වන විට අවසන් කළ නොහැකි විය. මෙසේ වැඩ අවසන් නොකළ සියළු ව්‍යාපෘති 2019 වර්ෂයේ ප්‍රථම කාර්තුව තුල අවසන් කරනු ලැබිණි. |

**3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | ----------------------------------------- |
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු අමාත්‍යාංශයේ නිලධාරීන් 61 දෙනෙකු විසින් ඇප තබා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරින්ගේ ලැයිස්තු ප්‍රතිශෝධනය කර එම වාර්තා සෑම වර්ෂ 03ක් අවසානයේදීම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට ඇප තැබිය යුතුවීම. | සේවක ඇප තැන්පතු පිළිබඳ ඉදිරියේදී මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි. |

**3.5 පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වසර 02 ත් , වසර 07 ත් අතර කාලයක් ගත වී ඇති සිද්ධීන් 22 ක් සම්බන්ධයෙන් එකතුව රු.මිලියන 5.33 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළයුතුවීම. | මෙම වාහනවලින් 05ක් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනට අයත්ව තිබූ වාහන වේ. වාහන නඩත්තු කටයුතු මෙන්ම වාහන සම්බන්ධ සියළු කටයුතු උක්ත ව්‍යාපෘතිය මගින් සිදු කර ඇති අතර ව්‍යාපෘතිය අවසන්වූ පසු ලිපිගොණු අමාත්‍යාංශය වෙත භාර දී ඇත. රු.672,000 ක මුදලක් රජයට අයකරගෙන ඇති අතර අනෙකුත් හානි හා පාඩු ලෙස දක්වා ඇති ප්‍රමාණයන් රක්ෂණ මුදලින් අයකර ගැනීමේදී සිදුව ඇති අඩු කිරීම් වන අතර ඒ සම්බන්ධව කටයුතු කර ඉදිරියේදී අයකිරීම් හා කපා හැරීම් සම්බන්ධ අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. |
| (ආ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනට අයත්ව තිබූ වාහන 05 කට සිදු වූ අනතුරු 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) හා (4) ප්‍රකාරව පිළියෙල කළ යුතු පරීක්ෂණ වාර්තා පිළියෙළ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ හානිය සිදු වූ පසුව ඒ අනුව කටයුතු කල යුතුවීම. | වාහනවලට සිදු වී ඇති අනතුරුවලට අදාළව මේ දක්වා මු.රෙ. 104 අනුව පරීක්ෂණ කටයුතු සිදු නොකරන ලද වාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනට අයත්ව තිබූ වාහන බව නිරීක්ෂණය වේ. එම අනතුරු සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු සිදු කිරීමට සටහන් කරගන්නා ලදී. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------------------------------ |
| ප්‍රාදේශීය වැව්ලි සමාගම් 16 ක් වෙත බදු පදනම මත රජය විසින් ලබා දී තිබූ ඉඩම්වලින් අක්කර 795.96 ක් හා එම වතුවලට අයත් නිල නිවාස 172 ක් අනවසර පුද්ගලයන් විසින් අත්පත් කරගෙන ඇතත් ඒවා නැවත පවරා ගැනීම සඳහා නිත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත අනුව කටයුතු කල යුතුවීම. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කිරීමේදී වැව්ලි කළමණාකරණ අධීක්ෂණ අංශයට විවිධ බලපෑම් පැවතීම හා ඇතැම් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මගින් අනවසර පදිංචිකරුවන් ඉවත් නොකිරීමට තීරණයන් ලබාගෙන තිබීම ද ප්‍රමාදයට හේතු වී ඇත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------------------------------ |
| අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් සහකාර අධ්‍යක්ෂ, සහකාර ලේකම්, ගණකාධිකාරින් දෙදෙනෙකු හා අභ්‍යන්තර විගණක වැනි තනතුරු වසරකට වැඩි කලක සිට පුරප්පාඩුව පැවතුණි. | තනතුරු පුරප්පාඩු පිරවිය යුතුවීම. | අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් සහකාර අධ්‍යක්ෂ, සහකාර ලේකම්, ගණකාධිකාරි හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා නිලධාරින් පත් කරන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන / රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත අවස්ථා කිහිපයකදී ම ලිපි යොමු කර ඇතත් මේ සඳහා නිලධාරින් අනුයුක්ත කර නොමැත. |